# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 14,878/1 — 1969 නොවැම්බර් 2 වැනි ඉරිද — 1969.11.2

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලැබේ)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

475 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය — අතිරේක ආහාර ද්‍රව්‍ය

### මිළ පාලන පනත

### නියෝගය

දිවයිනේ නියෝජ්‍ය මිල පාලක (ආහාර) තැන්පත් දෙවුන්දර ලියනගේ චන්ද්‍රසේකර වන මම, (173 වන අධිකාරය වන) මිළ ප ලන පනතේ 3(2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව :—

(1) 1969 ජූලි 19 වෙනි දින අංක 14,863/1 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1969 ජූලි 19 වෙනි දින අංක සී. 470 දරණ ආහාර මිළ නියෝගය මේ දැන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යයක් මෙරටට ගෙන්වන්නෙකු විසින් තොග වශයෙන් විකිණීමේ දී දල බර හොණ්ඩරයක් ද, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේ දී දළබර හොණ්ඩරයක් ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන් මේ උපලේඛනයේ 2 වෙනි 3 වෙනි හා 4 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්යය සඳහා—

(අ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(අ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමීත්වයේ හෝ පාලනය යටතේ හෝ තබ ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බනධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්යය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපෝයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව ද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින් ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය :

(අ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) :

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල :

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය එනම් වෙළෙඳාම තොග වශයෙන් ද, සිල්ලර වශයෙන් ද යනවග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව ද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත්, උපලේඛණයේ 2 වෙනි හා 4 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණින් වලට ඇතුළත් වන බව ද නියම කරමි.

ඩී. එල්. චන්ද්‍රසේකර,
දිවයිනේ නියෝජ්‍ය මිළ පාලක (ආහාර).

1969 නොවැම්බර් 2 වෙනි දින අ.භා. 2.15 ට කොළඹ දී,
අත්සන් කරන ලදී.

උපලේඛණය

| වර්ගය | 1 වැනි තීරය | 2 වැනි තීරය මෙරටට ගෙන්වන්නෙකු විසින් දළ බර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | 3 වැනි තීරය තොග වෙළෙන්දකු විසින් දළ බර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | 4 වැනි තීරය සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ |
|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| කොත්තමල්ලි ... ... ... ... | | — | 82 0 | 0 81 |
| රතු ඇනු ... ... ... ... | | — | 24 0 | 0 28 |
| ඇනු (රතු ඇනු හැර වෙනත් සියලුම වර්ග) ... ... | | 30 50 | 32 0 | 0 34 |

සැළකිය යුතුයි.—(I) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකියි.

(II) මෙරටට ගෙන්වන්නෙකු විසින් අය කරන මිළ හොණ්ඩර 10 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකුණන විට අය කරන මිළ විය යුතුය.

11—1254

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රේගු නිවේදනය—අංක 61/9/414

ආදායම් සංරක්ෂණ ආඥපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු මස 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥව අනුව, 1969 නොවැම්බර් මස 3 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්.එස්.එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එප්.ඕ.බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තු වලට අතිරේක වශයෙනි :—

**රබර්**

| | රු. | ශ. |
|---|---|---|
| නොම්මර එකේ ආර්.එස්.එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එප්.ඕ.බී. වටිනාකම—රාත්තලකට ... | 1 | 26 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ... | 0 | 17 |

ඒ. ට්. පණ්ඩිතරත්න,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ. 781,
1969 නොවැම්බර් මස 2 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

11–1252

---

## රේගු දැන්වීම—අංක 67/3/102

1967 නොවැම්බර මස 22 වැනි දින අංක 14,775/17 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1968.2.22 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වන ඡෙදය යටතේ පැනෙන ආඥව ක්‍රියාත්මක කිරීම සඳහා, 1969 නොවැම්බර් මස 3 වැනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරා වල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් රුපියල් 1,255.51 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ. :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | අඹු පොල්ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|
| රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 387.53 | 442.86 | 376.09 | 96.88 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තු වලට අතිරේක වශයෙනි.

ඒ. ට්. පණ්ඩිතරත්න,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ. 744/22,
1969 නොවැම්බර් මස 2 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

11–1253

---

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

සැ. යු.— 14,877/1 කාණ්ඩයේ අවසාන අති විශෙෂ ගැසට් අංකය 14,877/8 ය